{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
## Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැ.03 යි මි.10 යි |
|---|---|---|

### - . ශ්‍රී ලංකා ඉතිහාසය I (I කොටස)

පාසලේ නම :- ..........................................................................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................................................................

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ'
- **I කොටසෙහි** 1-40 දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න'
- **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 01 බැගින් හිමි වේ'
- කොටස් **02ටම** මුළු කාලය පැය තුනකි' පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න'

### I පත්‍රය

- **1 සිට 10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත' ඒවා අතුරෙන් **එකක්** පමණක් කවරක් හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ'** එම **නොගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන** තුළ ලියන්න'

01. 1) මහා විජයබාහු රජතුමා 2) මහා පරාක්‍රමබාහු රජතුමා
3) කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල රජතුමා 4) 1 වන ගජබාහු රජතුමා
5) 2 වන පරාක්‍රමබාහු රජතුමා
(''''''''''')

02. 1) ඩී.බී' ජයතිලක මහතා 2) අනගාරික ධර්මපාලතුමා
3) ඩී'එස්' සේනානායක මහතා 4) ටී'බී'පානබොක්කේ මහතා
5) මාකන් මාකර් මහතා
(''''''''''')

03. 1) තිවංකගාම 2) අනුරාධගාම 3) කාචරගාම 4) චන්දනගාම 5) විජිතගාම

04. 1) තෝණිගල ගිරි ලිපිය 2) පෙරිමියන්කුලම ලිපිය
3) තොණ්ඩවට්ටවාන් ලිපිය 4) වාදුරුප්පු ලිපිය
5) මිහින්තලා ලිපිය
(''''''''''')

05. 1) අරිට්ඨ පබ්බත 2) චේතිය පබ්බත 3) කාස පබ්බත
4) සිහගිරි පබ්බත 5) චිත්තල පබ්බත
(''''''''''')

06. 1) දන්තුරේ සටන 2) බලන සටන 3) වෙල්ලස්ස සටන
4) රන්දෙණිවල සටන 5) ගන්නෝරුව සටන (''''''''''')

07. 1) ගම්භීර නදී　2) කදම්භ නදී　3) ජජ්ජර නදී
4) කල්‍යාණිනදී　5) ගාල්භ නදී

(''''''''''''')

08. 1) සේනා සම්මත වික්‍රමබාහු　2) ජයවීර බණ්ඩාර　3) කරලියැද්දේ බණ්ඩාර
4) රයිගම් බණ්ඩාර　5) කොනප්පු බණ්ඩාර

(''''''''''''')

09. 1) අභයගිරිය　2) මහා සෑය　3) මිරිසවැටිය　4) කොට වෙහෙර　5) ලංකාරාමය

(''''''''''''')

10. 1) පනා බැමි　2) කළිඟු බැමි　3) පෝටා බැමි　4) පිටවාන බැමි　5) වැව් බැමි

(''''''''''''')

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද **යුගල** පහ බැගින් දී ඇත' ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැලපේ.** එම **නොගැලපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන** තුළ ලියන්න'

11. 1) ලෝවාමහාපාය - මහමෙව්නා උයනේ ඉදි වී ඇත'
2) රත්න ප්‍රාසාදය - අභයගිරි පොහොය ගෙය
3) ලංකාරාමය - පළමු විජයබාහු රජු ඉදි කළ දළදා මාලිගය
4) හත්ථාල්ලක මෙහෙණවර - මහා විහාරයේ භික්ෂුණී ආරාමය
5) මණ්ඩලගිරිය - මෙරට හොඳම වටදාගෙය

(''''''''''''')

12. 1) ස්පිටල්බර්ජන් - ලන්දේසි දූතයෙකි'
2) සී බෝල්ට් ද බාර්ට් - ලන්දේසි දූතයෙකි'
3) ජෝන් ෆයිබර්ස් - ඉංග්‍රීසි දූතයෙකි'
4) විලියම් මැකෙන්සි - ඉංග්‍රීසි දූතයෙකි'
5) හියු බොයිඩ් - ඉංග්‍රීසි ඉංග්‍රීසි දූතයෙකි'

(''''''''''''')

13. 1) අනුරාධපුරය - මල්වතු ඔය
2) සීගිරිය - කනදරා ඔය
2) පොළොන්නරුව - මහවැලි ගඟ
4) මහානාගකුල - වළවේ ගඟ
5) පරාක්‍රමපුර - කොළමුණු ඔය

(''''''''''''')

14. 1) පළමුවන සේන රාජ්‍ය කාලය - වාජිරීවාදය නම් දහම මෙරටට ගළාඒම'
2) ගෝඨාභය රාජ්‍ය කාලය - සාගල භික්ෂුව පැමිණීම'
3) වළගම්බා රාජ්‍ය කාලය - ධර්මරුචි භික්ෂූන්ගේ ආගමනය
4) ධාතුසේන රාජ්‍ය කාලය - ජේතවන නම් භික්ෂු නිකායේ ආගමනය
5) මහනාම රාජ්‍ය කාලය - බුද්ධඝෝෂ හිමියන්ගේ පැමිණීම' (''''''''''''')

15. 1) පණ්ඩුකාභය - ජය වැව
2) ධාතුසේන - කලා වැව
3) මහා නාග - වලස් වැව
4) වසභ - මින්නේරිය
5) දෙවන අග්බෝ - වළාහස්ස වැව (''''''''''''')

- අංක **16 සිට 20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නම, ප්‍රකාශක, දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත' **Y** තීරයේ ඇති නම, ප්‍රකාශක, දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ' එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට **නොවේ' Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදිය' නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න'

16. X | Y

| X | Y |
|---|---|
| 1) IV උදය රජතුමා | A. සංගමු විහාර ලිපිය' |
| 2) I වන විජයබාහු රජතුමා | B. තෝනිගල ලිපිය |
| 3) වසභ රජතුමා | C. යටාල දාගැබ ලිපිය |
| 4) කිත්සිරිමේඝ රජතුමා | D. බදුලු ටැම් ලිපිය |
| 5) I වන පරාක්‍රමබාහු රජතුමා | E. අඹගමුව ශිලා ලිපිය |

1) DECAB 2) DCEAB 3) DBECA 4) DECBA 5) DAECB

(''''''''''''')

17.

| X | Y |
|---|---|
| 1) බැල්දියස් | A. රත්න පංඤ්ඤ හිමි |
| 2) රෙබෙයිරෝ | B. ලංකාධිපත්‍ය |
| 3) ක්වේරෝස් | C. ලංකා පුරාවෘතාන්තය |
| 4) ප්‍රොකෝපියස් | D. ලංකා ඉතිහාසය |
| 5) ජිනකාලමාලි | E. පර්සියානු යුද්ධය |

1) CDBEA 2) CEDBA 3) CADBE 4) CDAEB 5) CBDAE

(''''''''''''')

18.

| X | Y |
|---|---|
| 1) ඇළහැර අමුණ | A. දැදුරුඔය |
| 2) මිණිපේ අමුණ | B. වළවේ ගඟ |
| 3) දෝරදත්තික අමුණ | C. කළු ගඟ |
| 4) හත්තොට අමුණ | D. මහවැලි ගඟ |
| 5) ටැන්කැටි | E. අඹන් ගඟ |

1) EDACB 2) BEDCA 3) EBACB 4) EDABC 5) ACDEB

(''''''''''''')

19.

| X | Y |
|---|---|
| 1) නීල මහා යෝධයා | A. ශ්‍රී පාදය පිරිසකර කිරීම |
| 2) පොත්ථ් පුට්ඨ සෙනවියා | B. ගජබා දවස ඉන්දීය ආක්‍රමණයට සහය දීම |
| 3) සේන සෙනෙවියා | C. දෙවන ගජබාහු දවස මලය දේශය මලය දේශය පාලනය කිරීම |
| 4) රක්ඛ සෙනෙවියා | D. හත්ථදාඨ රජු බලයෙන් පහ කිරීම |
| 5) දේවපතිරාජ ඇමතියා | E. වල්ලභ ආක්‍රමණය පලවා හැරීම |

1) BDAEC 2) BCDEA 3) BDECA 4) BCDAE 5) BCDEA

(''''''''''''')

20. X Y

| X | Y |
|---|---|
| 1) හලාවත සංගමය | A. අනගාරික ධර්මපාල තුමා |
| 2) සිංහල මහා සභාව | B. ඩී' අරුනාචලම් මහතා |
| 3) ලංකා සම සමාජ පක්ෂය | C. එස්'ඩබ්'ආර්'ඩී' බණ්ඩාරනායක |
| 4) මහා බෝධි සමාගම | D. ඇන්'ඇම්' පෙරේරා |
| 5) ලංකා ජාතික සංගමය | E. වික්ටර් කොරයා |

1) EDCAB 2) ECDAB 3) EBCDA 4) EABCD 5) EABCD

(''''''''''')

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත' එම කරුණු අතුරෙන් එකක් **අදාළ මාතෘකාවට නොගැලපේ'** එය තෝරා ඊට අදාල **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න'

21. 1815 උඩරට ගිවිසුම'
    1) මහනුවර ඓතිහාසික මඟුල් මඩුවේදී අත්සන් කරන ලද්දකි'
    2) මෙම ගිවිසුම සකස් කිරීමේ ප්‍රධාන වගකීම ජෝන් ඩොයිලි විසින් සිදු කරන ලදී'
    3) ගිවිසුමේ පස්වන වගන්තියෙන් බුද්ධාගම හා දේවාගම ආරක්ෂා කිරීමට බ්‍රිතාන්‍යයෝ එකඟ වූහ'
    4) උඩරට ගිවිසුම ඇතැම් රදළයින් දෙමළ භාෂාවෙන් ද අත්සන් කොට ඇත'
    5) බ්‍රිතාන්‍යයන් වෙනුවෙන් ෆෙඩ්‍රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා මෙයට අත්සන් තබා ඇත'

(''''''''''')

22. ශ්‍රී ලංකාවේ වතු වගාව'
    1) බ්‍රිතාන්‍ය යුගය තුළ කෝපි වගාව මහා පරිමාණව වගා කරන්නට විය'
    2) කෝල්බෲක් යෝජනාවලියේ ඇතැම් යෝජනා වතු වගාවේ දියුණුවට ප්‍රබල ලෙස බලපාන ලදී'
    3) බ්‍රිතාන්‍යයෝ පොල් වගාව දියුණු කිරීම සඳහා පර්යේෂණ ආයතනයක් තලවකැලේ නගරයේ ආරම්භ කරන ලදී'
    4) තේ, කෝපි, කොකෝවා, රබර් වැනි බෝග වතු වගාව තුළ වගා වී තිබේ'
    5) වගාවට අවශ්‍ය ශ්‍රමය දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව කටයුතු කර ඇත'

(''''''''''')

23. සීතල සංගය
    1) ලංකාවේ දකුණු දිග ප්‍රදේශයේ ඇති වූවකි'
    2) සිරිවර්ධන පතිරාජ හා කුරගම හිමියන් මේ කැරැල්ලේ සැකකරුවන් යැයි සළකා ඝාතනය කර ඇත'
    3) සීතල සංගයට ආසන්න හේතුව සපුමල් කුමාරයා අම්බුලුගල කුමාරයාගෙන් බලය පැහැර ගැනීමයි'
    4) කෝට්ටේ යුගය තුළ ඇති වූ දේශපාලන අර්බුදයකි'
    5) හයවෙනි බුවනෙකබාහු රජු දවස සිදුවූවක් සේ සළකනු ලැබේ'

(''''''''''')

24. 19 වන සියවස අග බ්‍රිතාන්‍ය පාලනය යටතේ වාරි කර්මාන්ත පද්ධතිය'

1) ඉරක්කාට්ටම් වැව පිළිසකර කරන්නේ හෙන්රි බෝඩ් ආණ්ඩුකාරවරයාය'
2) කලා වැව පිරිසකර කිරීමට ආතර් ගෝර්ඩන් ආණ්ඩුකාරවරයා ක්‍රියා කර ඇත'
3) 1848 අරගලෙන් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයින් දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ක්‍රියා කර ඇත'
4) ෆෙඩ්‍රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා නිල්වලා ගඟේ ඌරුබොක්ක ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී'
5) විලියම් ග්‍රෙගරි, හර්කියුලිස් රොබින්සන්, වෙස්ට් රිජ්වේ යන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයින්ද, මෙරට වාරි කර්මාන්තය පිළිසකර කිරීමට කටයුතු කළහ'

(''''''''''')

25. අවුකන පිළිමය'

1) ක්‍රි'ව' 05 වන සියවසේ දී පමණ ඉදි වන්නට ඇතැයි විශ්වාස කෙරේ'
2) කාලසේන පතිමා නමින් හඳුන්වන්නේ ද මෙයයි'
3) ආන්ද්‍ර කලා බලපෑම යටතේ නිර්මාණය කරන ලද්දකි'
4) අනුරාධපුර යුගයට අයත් හිඳි පිළිමයන් අතර හොඳම පිළිමයයි'
5) කලා වැව සමීපයේ පිහිටා ඇත'

(''''''''''')

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර ඇසුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදිය' නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

A සහ B පමණක් නිවැරදි නම් **1 ද**

A සහ C පමණක් නිවැරදි නම් **2 ද**

B සහ C පමණක් නිවැරදි නම් **3 ද**

C සහ D පමණක් නිවැරදි නම් **4 ද**

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් **5 ද වරහන තුළ** ලියන්න'

(''''''''''')

26. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A- බෞද්ධ සාහිත්‍යයේ එන තොරතුරු වලට අනුවද මෙරට මුල් ජනයා ජීවත් වූ බවට සාධක ඇත'

B- කුවේණි වෘතාන්තය අනුව ආර්යයන් පැමිණීමට පෙර මෙරට ජනයා සිටි බවට තොරතුරු ඇත'

C- මහා භාරතය, රාමායණය, දිව්‍යාවදානය යනාදී මෙරට ප්‍රාග් ජනාවාස පිළිබඳ තොරතුරු ඇත'

D- දිවයිනේ සම්ප්‍රදායික ඉතිහාසය රාවණ රජුගෙන් ආරම්භ වේ'

(''''''''''')

27. ලක්දිව බුද්ධාගම ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?

A- මිහිඳු මහා තෙරුන් හා දේවානම්පියතිස්ස රජු අතර ප්‍රථම හමුවීම සිදුවියේ මිහින්තලාවේදිය'

B- මිහිඳු මහ තෙරුන් විසින් ලක්දිව භික්ෂු ශාසනය පිහිටුවන ලදී'

C- උත්තිය රජු විසින් මහමෙව්නා උයන මහා සංඝයාට පූජා කරන ලදී.

D- වෙසක් මස පුර පසළොස්වක පොහෝ දිනයේ දී බුදු දහමේ පණිවුඩය ලක්දිවට ගෙන එන ලදී'

(''''''''''')

28. මහා විජය බව රජුගේ මරණින් පසුව මෙරට දේශපාලනය පිළිබඳ කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A- විජයබා රජුගේ මරණයෙන් පසුව රාජ්‍යත්වයට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණත් ජයබාහු කුමාරයාය'

B- පළමු වික්‍රමබාහු කුමරුට මහාධිපාදි තනතුර නොදී රජුගේ නැගණිය වූ මිත්තා හට එම තනතුර තම පුතුට ලබා දීමට කටයුතු කර ඇත'

C- දෙවන ගජබාහු රජු විජයබාහු රජුගේ වැඩිමහල් පුතා ඝාතනය කර බලය ලබා ගනී'

D- කාලිංග මාඝ මෙරට ආක්‍රමණය කරන්නේ විජයබාහු රජුගේ මරණයත් සමඟයි'

(''''''''''''')

29. ක්‍රි'ව' 1766 දි අත්සන් තැබූ ගිවිසුම පිළිබඳ කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි ද?

A- මෙම ගිවිසුමට උඩරට පාර්ශවයෙන් අත්සන් තබන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුය'

B- ලන්දේසීන් හා උඩරට අතර ඇති වූ මේ ගිවිසුමට ලන්දේසී පාර්ශවයෙන් විලියම් ෆැල්ක් අත්සන් තැබිය'

C- ගිවිසුමට අනුව උඩරට රජු සිංහල ගව්වක බිම් තීරයක් මුහුදුබඩින් ලන්දේසින්ට ලබාදීමට එකඟ විය'

D- එලෙස ලැබුණු බිම් තීරුව මිනුම් මණ්ඩලයක් හරහා මැනගන්නා බවද ගිවිසුම් තුළ සඳහන් විය'

(''''''''''''')

30. දන්තුරේ සටන පිළිබඳ කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදිද?

A- ක්‍රි'ව' 1594 දී දන්තුරේ නම් නගරය ආසන්නයේ දී සිදුවී ඇත'

B- ජෝන් රැබෙයිරෝ මේ සටන පිළිබඳ තම කෘතියෙන් තොරතුරු වාර්තා කරයි'

C- දෙවන රාජසිංහ රජු හා පෘතුගීසින් අතර සිදුවූ සටනක් ලෙස මෙය සටහන් වේ'

D- අසවේදු ඇතුලු සමස්ථ පෘතුගීසි හට හමුදාව මේ සටනේ දී මරණයට පත් විය'

(''''''''''''')

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න'

31. බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව මෙරටට ගෙන ඒම සඳහා ඉන්දියාව බලා ගිය භික්ෂුව කවුරුන්ද?

(1) නිග්‍රෝධ සාමණේර (2) භද්‍රසාල හිමි (3) මිහිඳු හිමි
(4) සුමන සාමණේර (5) අරිට්ඨ භික්ෂුව

32. වෛතුල්‍යවාදීන් සමග වාද කර ථෙරවාදය ආරක්ෂා කිරීමට කටයුතු කළ පළමු අන්තබෝධි රජු දවස කියැවෙන භික්ෂුව කවුද?

(1) ජෝතිපාල හිමි (2) වජ්‍රබෝධි හිමි (3) සංඝමිත්‍ර හිමි
(4) බුද්ධඝෝෂ හිමි (5) ධර්මරුචි හිමි

33. මහනුවර දළදා මාලිගාව හා සම්බන්ධ පෙරහැර ආරම්භ කරන ලද්දේ කවර රාජ්‍ය සමයේද?

(1) ශ්‍රී විජය රාජසිංහ (2) රාජාධිරාජසිංහ (3) පළමු රාජසිංහ
(4) කීර්ති ශ්‍රී රාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ

34. මෙරට ප්‍රථම සිංහල අග්‍රාණ්ඩුකාරවරයා කවුද?

(1) සෝල්බරි සාමි (2) ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා (3) විලියම් ගොපල්ලව මහතා
(4) ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් (5) හේන්රි මන්ක් මේසන් මුවර් මහතා

35. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයන් තුළ ප්‍රථම කපිතාන් ජෙනරාල් ලෙස පත්වී ඇති පෘතුගීසි ජාතිකයා කවුද?

(1) මාටින් අපොන්සු සූසා (2) දියෝගෝ ද මේලෝ කැස්ත්‍රෝ (3) පේරෝ ලෝපේස් ද සූසා

(4) අල්වාරිස් පෙරෙයිරා (5) ලොරෙන්සෝද අල්මේදා

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ දෙක බැගින් දී ඇත' එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවේ දැක්වෙන **1,2,3,4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාල **අංකය වරහන තුළ** ලියන්න'

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදිය' | වැරදිය' |
| 2 | නිවැරදිය' | නිවැරදිය' |
| 3 | වැරදිය' | වැරදිය' |
| 4 | වැරදිය' | නිවැරදිය' |
| 5 | නිවැරදිය' | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි' |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36 | වට්ටගාමිණී රජු සද්ධාතිස්ස රජුගේ බාලම සහෝදරයාය' | ඔහු බලයට පත්වන්නේ ථූලක්ථක නම් දකුණු ඉන්දීය ආක්‍රමනිකයා ඝාතනය කරමිනි' | ('''''''''''') |
| 37 | සද්ධාතිස්ස කුමරු හා දුටුගැමුණු කුමරු අතර යුද්ධය සමතයකට පත් කිරිම ගෝඨගත්ත තිස්ස හිමි මැදිහත්විය' | වලගම්බා රජු ක්‍රි' පූ' 89 දී දාඨිය නම් දෙමලා මරා දමා අනුරාධපුරයෙන් බලයට පත්විය' | ('''''''''''') |
| 38 | පළමුවන පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ බලයට පත්වන්නේ ක්‍රි' ව' 1140 දීය' | ඔහු තම දක්ඛිණ දේශයෙන් පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගන්නේ පරාක්‍රමපුර හෙවත් පඬුවස්නුවරයි' | ('''''''''''') |
| 39 | ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා වූයේ පොන්නම්බලම් රාමනාදන් මහතාය' | මෙරට ප්‍රථම පාර්ලිමේන්තු අගමැතිවරයා වූයේ ආචාර්යය එන්'එම්' පෙරේරා මහතාය' | ('''''''''''') |
| 40 | නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළේ විලියම් ගොපල්ලව මහතාය' | මෙරට ප්‍රථම විධායක ජනාධිපති ධූරය ස්ථාපිත කළේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළිනි' | ('''''''''''') |

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024

ශ්‍රී ලංකා ඉතිහාසය I (II කොටස)

පාසලේ නම :- ..........................................................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................................................

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස් :

- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- II කොටස **A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** යුක්ත ය.
- **A කොටසේ** ප්‍රශ්න අනිවාර්ය වේ.
- **B** හා **C** කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.)

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | මුල්ලේරියාව | vii. | කදුරුගොඩ |
| ii. | සීගිරිය | viii. | හුරුළු වැව |
| iii. | කලාවැව | ix. | බදුල්ල |
| iv. | දකුණු පළාත | x. | යාපහුව |
| v. | කතරගම | xi. | ලංකාපටුන |
| vi. | සීතාවක | xii. | ඉරණමඩු |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

## B කොටස

02. මහසෙන් රජතුමාගේ රාජ්‍ය සමයේ අවසානය තෙක්, ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහි ලා මහාවංශයේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න

(ලකුණු - 16)

03. "ශ්‍රී ලංකාව තනි දේශපාලන ආධිපත්‍යයකට පැමිණියේ" මාගම පාලකයින්ගේ කාර්ය සාපල්‍ය නිසාය."

i. දුටුගැමුණු රජතුමාගේ කාර්ය විස්තර කොට ඇති මහාවංශ කතුවරයා කවිද? (ලකුණු - 01)

ii. කාවන්තිස්ස රජුට පෙර සිටි මාගම පාලනය කළ පාලකයින් දෙදෙනකු නම් කරන්න' (ලකුණු - 02)

iii. දුටුගැමුණු රජුට පෙර සිටි මාගම පාලකයින්ගේ කාර්ය සාඵල්‍ය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

iv. දුටුගැමුණු රජු මාගම පෙළපතේ ශ්‍රේෂ්ට පාලකයා ලෙස කල කාර්ය සාඵල්‍යය විස්තර කරන්න. (ලකුණු - 08)

04. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

i. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා

ii. දඹදෙණි යුගයේ සංස්කෘතික වර්ධනය

iii. රටේ ආර්ථික සංවර්ධනයට වසභ රජුගේ දායකත්වය

iv. අනුරාධපුර රාජධානියේ පරිහානිය (ලකුණු 8×2 = 16)

05. අනුරාධපුර යුගයේ එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු - 16)

## C කොටස

06. මහනුවර රාජධානි සමයේ එහි ක්‍රියාත්මක වූ පරිපාලන, සමාජ හා ආර්ථික රටාව පිළිබඳව රචනයක් ලියන්න.

(ලකුණු - 10)

07. දෙවන රාජසිංහ රජුගේ කාර්ය සංසිද්ධීන් පහත දැක්වෙන ශීර්ෂ යටතේ ප්‍රමාණ කරන්න.

i. පෘතුගීසින්ගෙන් මුහුදුබඩ ප්‍රදේශ නිදහස් කරගැනීම.

ii. ලන්දේසි බලපෑම්වලින් උඩරට ආරක්ෂා කරගැනීම. (ලකුණු - 16)

08. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. 1818 පළමු නිදහස් අරගලය

ii. I රාජසිංහ රජතුමා

iii. වැලිවිට ශ්‍රී සරණංකර හිමි

iv. කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

(ලකුණු 8 x 2 = 16)

09. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.


i. සර්වජන ඡන්ද බලය

ii. ආණ්ඩුකාරවරයා

iii. විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය (ලකුණු - 10)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!




PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!